චක්‍රලේඛ අංකය: 09/2018

# අධ්‍යාපන අමාත්‍යාංශය
# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය

(2018 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි)


ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල


Scanned with CamScanner

# පටුන


| | පිටුව |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය | i - ii |
| තරග වර්ග | iii |
| අභිමතාර්ථ | iv |
| චක්‍රලේඛය - සිංහල | v |
| දෙමළ | vi |
| ඉංග්‍රීසි | vii |
| තරග පැවැත්වීම - පොදු උපදෙස් | ix - xiii |
| 1. ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | 01 |
| I කොටස | |
| II කොටස | |
| 2. පද්‍ය නිර්මාණ හා අවබෝධය | 04 |
| 3. භාෂා භාවිතය හා අවබෝධය | 07 |
| 4. සාහිත්‍ය දැනුම මිනුම | 08 |
| 5. අත් අකුරු හා භාෂාවේ ශිල්පීය ක්‍රම | 10 |
| 6. කෙටි කතා | 12 |
| 7. ගේය පද රචනා | 13 |
| 8. කෙටි නාට්‍ය පිටපත් | 15 |
| 9. කවි | 16 |
| 10. කියවීම | 18 |
| 11. පද්‍ය ගායනා | 19 |
| තරග පැවැත්වීමේ වගකීම හා විස්තර | |
| ප්‍රතිඵල ආකෘති | |


Scanned with CamScanner

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය

සිංහලය බහුතර ශ්‍රී ලාංකේය ජනතාවගේ මාතෘ භාෂාව යි. පාසල් අධ්‍යාපනයෙන් දරුවකු වැඩි ම කාලයක් කැප කරනුයේ මව් භාෂා අධ්‍යාපනයටයි. භාෂාවක පොදු අරමුණ වන්නේ චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කර ගැනීමයි. භාෂණය, ශ්‍රවණය, කියවීම හා ලේඛනය යන හැකියා චතුර්විධ භාෂා කුසලතා ලෙස හැඳින ගෙන ඇත. භාෂා විෂයට ඉහළ සාධන මට්ටමක් පාසල් දරුවෝ ප්‍රදර්ශනය කරති. එහෙත් සිංහල භාෂාවට ඉහළ සාධනයක් පෙන්වා තිබිය දී පවා එකී භාෂාව නිවැරදිව හා නිර්මාණශීලීව භාවිත කිරීමට සිසු දරුවෝ මෙන් ම වැඩිහිටියෝ ද සතුටුදායක හැකියා ප්‍රදර්ශනය නොකරති.

සිංහල භාෂා විෂය පාසල් පන්ති කාමරය තුළ ඉගැන්වීමෙන් අරමුණු රාශියක් මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂා කරමු. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත බව ලැබීම, සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලීන් හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම සහ අවබෝධය ලබා ගැනීම, වාග්මාලාව පෝෂණය කිරීම, සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ආදී විශ්වවිශ්‍රුත ඥානය උකහා ගැනීම ආදිය ඒ අරමුණු අතර වෙයි. පන්ති කාමර තුළ සිංහල විෂය ඉගැන්වීමට අමතරව මෙවැනි තරගාවලියක් සංවිධානය කිරීමෙන් දරුවන් තුළ නිසගව පිහිටි දක්ෂතා ඉස්මතු කර ගැනීමට හැකියාව ලැබෙන අතර භාෂාමය හැකියා ඇගයීමට අවස්ථාවක් ලැබේ. ඒ සඳහා මෙම සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය සිංහල භාෂාවේ සෑම ක්ෂේත්‍රයක් ම නියෝජනය වන පරිදි තරග 11 කින් සමන්විත වේ. මෙම තරගාවලිය පැවැත්වීමෙන් පන්ති කාමර ඉගැන්වීමේ ක්‍රියාවලියෙන් ලැබෙන කුසලතා තවදුරටත් සංවර්ධනය කොට ඔවුන්ගේ එම විශිෂ්ට කුසලතා ජාතික මට්ටමින් ඇගයීමටත් අවස්ථාව ලැබේ.

මෙම චක්‍රලේඛය මගින් පාසල්, කලාප, පළාත්, සමස්ත ලංකා සහ ජාතික ලෙස මට්ටම් 05කින් තරග පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙයින් පාසල් මට්ටමේ තරගාවලිය වඩාත් වැදගත් මෙන් ම වඩාත් වැඩි සැලකිල්ලක් දක්වමින් පැවැත්විය යුතු බව විදුහල්පතිවරුන්ටත් ගුරුභවතුන්ටත් විශේෂයෙන් අවධාරණය කරමි. පාසල්වල සියලු ම සිසුන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රේණි මට්ටමින් මෙම තරගය පැවැත්වීම අත්‍යවශ්‍ය බව අවධාරණය කිරීමට කැමැත්තෙමි. එසේ ම පාසල් මට්ටමින් තෝරා ගන්නා සිසුන් ම ඊළඟ තරග





Scanned with CamScanner

අවස්ථාව සඳහා ඉදිරිපත් කිරීමට විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් උනන්දු විය යුතු ය. ඒ ඒ මට්ටම්වල දී අදාළ නිලධාරීන් වගකීමෙන් යුතුව තරග පවත්වා සිසුන් ඊළඟ තරග අවස්ථාව සඳහා යොමු කිරීමට අවධානය යොමු කළ යුතු ය. විශේෂයෙන් ම කලාප හා පළාත් තරගවලින් ජයග්‍රහණය ලබන පළමු හා දෙවන ස්ථාන ලබන සිසුන් සමස්ත ලංකා මට්ටමේ තරගවලට යොමු කිරීමේ දී චක්‍රලේඛයේ නියමයට ම අනුව කටයුතු කිරීමෙන් මේ සඳහා ඉදිරිපත් වන දරුවන්ට සාධාරණ අවස්ථා සලසා දීමට කටයුතු කරන ලෙස ඉල්ලමි. මෙම තරග පැවැත්වීමේ දී වගකිවයුතු ඔබ සැමගේ පූර්ණ සහයෝගය උදක් ම අපේක්ෂා කරමි.

ආර්. එම්. එම්. රත්නායක
අතිරේක ලේකම්
2018 මැයි 20 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.



Scanned with CamScanner

# තරග වර්ග

මෙම තරගාවලියේ දී පැවැත්වෙන තරග වර්ගත්, ඒ ඒ තරග කවර ශ්‍රේණිය සඳහා ද යන්නත්, ඒ ඒ වර්ගය යටතේ පැවැත්වෙන මුළු තරග සංඛ්‍යාව කොපමණ ද යන්නත් පහත සඳහන් වගුවෙහි දැක්වේ. ඔබ තරග සංවිධානය කළ යුත්තේ මෙම වගුවට අනුකූලව ය.

| | තරග වර්ගය | ශ්‍රේණිය | | | | | | | මුළු තරග ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12/13 | |
| 1. | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | X | X | X | X | X | X | X | 07 |
| 2. | පද්‍ය නිර්මාණ හා අවබෝධය | X | X | X | X | X | X | X | 07 |
| 3. | භාෂා භාවිතය හා අවබෝධය | X | X | X | X | X | X | X | 07 |
| 4. | සාහිත්‍ය දැනුම මිනුම | X | X | X | X | X | X | X | 07 |
| 5. | අත් අකුරු හා භාෂාවේ ශිල්පීය ක්‍රම | X | X | X | X | X | X | - | 06 |
| 6. | කෙටි කතා | - | - | - | - | X | X | X | 03 |
| 7. | ගේය පද රචනා | - | - | - | - | X | X | X | 03 |
| 8. | කෙටි නාට්‍ය පිටපත් | - | - | - | - | X | X | X | 03 |
| 9. | කථික | X | X | X | X | X | X | X | 07 |
| 10. | කියවීම | X | X | X | X | - | - | - | 04 |
| 11. | පද්‍ය ගායනා | X | X | X | X | X | X | X | 07 |
| | මුළු තරග ගණන | | | | | | | | 61 |

එක් ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට සහභාගි විය හැකි උපරිම තරග සංඛ්‍යාව තුනකි.



Scanned with CamScanner

# අභිමතාර්ථ

1. ශ්‍රී ලාංකේය ළමා පරපුරෙහි සිංහල භාෂා ඥානය පෝෂණය කිරීම

2. ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා නිවැරදිව වර්ධනය කර ගැනීමට මග පෙන්වීම

3. ප්‍රායෝගික හා නිර්මාණාත්මක ලේඛන කුසලතා සංවර්ධනය කිරීම

4. භාෂා කුසලතා මගින් ස්වකීය සංස්කෘතිය හැඳින ගැනීමටත් අගය කිරීමටත් සංරක්ෂණය කරගැනීමටත් අවශ්‍ය ආකල්ප සාධනය කිරීම

5. සිංහල ලේඛන හා භාෂණ කුසලතා වර්ධනය කිරීම මගින් ජාතික අනන්‍යතාව පවත්වා ගැනීම

6. සිංහල සාහිත්‍ය රසවින්දනයට හා සාහිත්‍ය විචාරයට හුරු කිරීම

7. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ඔස්සේ ජාතික චින්තනය අනාගත පරපුරට පවරා දීම

8. භාෂාව හා සාහිත්‍යය ඔස්සේ ජාතික සමගිය සුරක්ෂිත කර ගැනීම



Scanned with CamScanner

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/05/02/03/49 ඔබේ යොමුව / உமது இல. / Your Ref. } දිනය / திகதி / Date } 2018.03.12

චක්‍රලේඛ අංකය - 09/2018

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පළාත් විෂය සම්බන්ධීකරණ නිලධාරීන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප විෂය සම්බන්ධීකරණ නිලධාරීන්
සියලු ම විදුහල්පතිවරුන්
සියලු ම සිංහල විෂය ගුරු උපදේශකවරුන්

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය: පාසල්, කලාප, පළාත්, සමස්ත ලංකා හා ජාතික මට්ටමේ වාර්ෂික තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛ සංශෝධනය - 2018**

අධ්‍යාපන ලේකම්ගේ චක්‍රලේඛ අංක 2012/48 හා 2012.02.20 දිනැති සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලියට අදාළ චක්‍රලේඛය 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි. ඒ අනුව පාසල් මට්ටමේ සිට සියලු ම මට්ටම් ආවරණය වන පරිදි සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය, මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන සමඟින් මෙයට අමුණා එවා ඇති අත් පොතෙහි සඳහන් විධිවිධාන අනුව ප්‍රශස්ත අයුරින් සංවිධානය කොට ක්‍රියාත්මක කළ යුතු ය.

2018 වර්ෂයේ සිට ඉදිරි වසර 05 ක් සඳහා ක්‍රියාත්මක වීමට නියමිත මෙම චක්‍රලේඛ විධිවිධාන උපදෙස් පළාත්, කලාප හා පාසල් මට්ටමින් නිසි පරිදි දැනුවත් කරමින් ඒ ඒ මට්ටමින් වාර්ෂිකව මෙම තරගාවලිය සංවිධානය කොට පැවැත්වීම අවශ්‍ය වේ. ඉන් අනතුරුව සමස්ත ලංකා මට්ටමේ හා ජාතික මට්ටමේ ජයග්‍රාහී සිසු සිසුවියන් තෝරා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතු බව ද මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 / +94112784825 / minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk



Scanned with CamScanner

அධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50
+94112785818
info@moe.gov.lk
www.moe.gov.lk

My Ref. ED/01/05/02/03/49 Your Ref. Date 2018.03.12

சுற்றுநிருப இல -: **09/2018**

சகல மாகாணக் கல்விச் செயலாளர்கள்
சகல மாகாணக் கல்விப் பணிப்பாளர்கள்,
சகல மாகாணப் பாட இணைப்பாளர்கள்,
சகல வலயக் கல்விப் பணிப்பாளர்கள்,
சகல கோட்டக் கல்விப் பணிப்பாளர்கள்,
சகல வலயப் பாட இணைப்பாளர்கள்
அதிபர்கள்,
சகல சிங்கள மொழிப் பாடஆசிரிய ஆலோசகர்கள்.

**சிங்களமொழி மற்றும் இலக்கியப் போட்டிகள்: பாடசாலை, வலய, மாகாண, அகில இலங்கை மற்றும் தேசிய மட்டத்தில் வருடாந்தம் நடாத்தப்படும் போட்டிகள் தொடர்பான சுற்றுநிருபத் திருத்தம் -2018.**

கல்விச் செயலாளரின் 2012/48ம் இலக்கம் மற்றும் 2012.02.20ம் திகதிய சிங்கள மொழி மற்றும் இலக்கியப் போட்டிகளுடன் தொடர்பான சுற்று நிருபம் 2018.01.01ம் திகதி முதல் நடைமுறைக்கு வரும் வகையில் திருத்தங்கள் செய்யப்படுகின்றன. அதற்கமையப் பாடசாலை தொடக்கம் சகல மட்டங்களுக்கும் பொருந்தும் வகையில் வருடாந்த சிங்கள மொழி மற்றும் இலக்கியப் போட்டிகள் இச் சுற்றுநிருபத்தில் குறிப்பிடப்பட்டுள்ள விதிகளுடனும் இத்துடன் இணைத்து அனுப்பி வைக்கப்பட்டுள்ள கைநூலில் குறிப்பிடப்பட்டுள்ள விதிகளுக்கு அமைவாகவும் இப்போட்டிகளைச் சிறப்பான முறையில் ஒழுங்கு செய்து நடைமுறைப்படுத்துதல் வேண்டும்.

2018ம் ஆண்டு முதல் எதிர்வரும் ஐந்து வருடங்களுக்கு நடைமுறையில் இருக்கும் இச் சுற்று நிருபத்தின் விதிமுறைகள் மாகாண, வலய, மற்றும் பாடசாலை மட்டங்களுக்கு உரியமுறையில் தெளிவுபடுத்தி அவ்வவ் மட்டங்களில் வருடந்தோறும் இப்போட்டிகளை ஏற்பாடு செய்து நடாத்துதல் வேண்டும். அதன்பின் அகில இலங்கை மற்றும் தேசிய மட்டத்தில் வெற்றிபெறும் மாணவ மாணவியரைத் தெரிவு செய்து கொள்வதற்கான நடவடிக்கைகள் கல்வி அமைச்சின் மூலம் மேற்கொள்ளப்படல் வேண்டும் என்பதைத் தயவுடன் அறியத்தருகிறேன்.

**சுனில் ஹெட்டிஆரச்சி**
செயலாளர்
கல்வி அமைச்சு

Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk



Scanned with CamScanner

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/05/02/03/49 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 12.03.2018

Circular No: 09/2018

All Provincial Secretaries of Education
All Provincial Directors of Education
All Provincial Coordinating Officers in charge of the Subject
All Zonal Directors of Education
All Divisional Directors of Education
All Zonal Coordinating Officers in charge of the Subject
All Principals
All Teacher Advisers in charge of the Subject of Sinhala

**Sinhala Language and Literary Competition: Revision of Circulars for the conduct of Annual Competition in School, Zonal, Provincial, All Island and National Levels - 2018**

The circular issued by the Ministry of Education bearing No. 2012/48 dated 20.02.2012 in relation to the Sinhala Language and Literary Competition is revised hereby with effect from 01.01.2018. Accordingly, the Sinhala Language and Literary Competition should be organized optimally and executed as per the provisions stipulated in the manual annexed herewith along with the provisions that are stipulated in this circular covering all the levels from school level.

It is required to organize and conduct this competition in each level by creating awareness on the provisions of this circular which is scheduled to be implemented for ensuing 05 years in provincial, zonal and school levels with effect from the year 2018. Subsequently, it is kindly informed that arrangements should be taken by the Ministry of Education for selecting the winners in the all island and national levels.

Sunil Hettiarachchi
Secretary of the Ministry of Education

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk



Scanned with CamScanner

## තරග පැවැත්වීම - පොදු උපදෙස්

සෑම තරගයක් ම ආරම්භයට පෙර මෙහි එන අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය. තරගයට ඉදිරිපත්වීමේ දී නිවැරදි නම, පාසල, ලිපිනය, පාසල් කාණ්ඩය, ශ්‍රේණිය, කලාපය, පළාත සටහන් නොකිරීම තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වෙයි. සියලු ම තරග සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

### ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ග කිරීම හා තරග මට්ටම්

1. පාසල් වර්ග කිරීම

ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල සිසුන්ට අවස්ථාවක් ලබාදීමේ අරමුණ ඇතිව හයවන ශ්‍රේණියෙන් ඉහළ ඉගෙනුම ලබන සිසුන්ගේ සංඛ්‍යාව සලකා පාසල් වර්ග තුනකට බෙදා සෑම තරගයක් ම පවත්වනු ලැබේ.

1. සිසුන් 200 තෙක් පාසල්
2. සිසුන් 201 - 500 තෙක් පාසල්
3. සිසුන් 500ට වැඩි පාසල්

සැ. යු. :- මෙම සංඛ්‍යාව ගණනය කළ යුත්තේ තරගයට අදාළ වර්ෂයට පෙර වර්ෂයේ පාසල් සංගණනයේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ය. මෙහි දී ගණනය කළ යුත්තේ හයවන ශ්‍රේණියෙන් ඉහළ ඉගෙනුම ලබන සිසුන් පමණක් බව අවධාරණය කෙරේ.

2. තරග පැවැත්වෙන මට්ටම්

1. පාසල් තරග
2. කලාප තරග
3. පළාත් තරග
4. සමස්ත ලංකා තරග
5. ජාතික තරග

3. තරගවලට සහභාගී වීමේ අවස්ථා

- පාසල් මට්ටමේ දී හයවන ශ්‍රේණියෙන් ඉහළ සියලු ම සිසුන්ට,
- කලාප මට්ටමේ පාසල් වර්ග අනුව පළමුවන, දෙවන ස්ථාන ලබාගත් සිසුන්ට,





Scanned with CamScanner

- පළාත් මට්ටමේ දී කලාපවලින් පාසල් වර්ග අනුව පළමුවන, දෙවන ස්ථානවලට තේරුණු සිසුන්ට,
- සමස්ත ලංකා මට්ටමේ දී පළාත්වලින් පාසල් වර්ග අනුව පළමුවන, දෙවන ස්ථානවලට තේරුණු සිසුන්ට,
- ජාතික මට්ටමේ දී පාසල් වර්ග අනුව සමස්ත ලංකා තරගයේ ප්‍රථම ස්ථානයට තේරුණු සිසුන්ට අවස්ථාව ලැබේ.

කලාප, පළාත්, සමස්ත ලංකා මට්ටම්වල දී පාසල් වර්ග අනුව 1,2,3 ස්ථානවලට තේරෙන ශිෂ්‍ය, ශිෂ්‍යාවන්ට ඒ ඒ මට්ටම්වල දී සහතිකයක් හිමි වේ. ජාතික මට්ටමේ දී පාසල් වර්ග නොසලකා 1,2,3 ස්ථාන සඳහා සහතික හිමි වේ. එබැවින් ඒ ඒ අවස්ථාවල දී අනිවාර්යයෙන් තෙවන ස්ථාන ද තෝරාගත යුතු ය.

## 4. තරග සංවිධානයේ දී ඒ ඒ මට්ටම් සඳහා විශේෂ උපදෙස්

### පාසල් තරග (පෙබරවාරි 28 හෝ 29 ට පෙර)

සිංහල භාෂාව හා සාහිත්‍ය පිළිබඳ දැනුම ප්‍රවර්ධනයත් සිසුන් අතර විෂයය කෙරෙහි ඇති උද්‍යෝගය වඩවාලීමත් මෙම තරගාවලියේ ප්‍රමුඛ පරමාර්ථවන හෙයින් සෙසු සියලු මට්ටම්වලට වඩා පාසල් මට්ටමේ තරග මෙහිලා වැදගත් තැනක් ගන්නා අතර, එය අනිවාර්ය වන බව ද සැලකිය යුතු ය. ඉහත පරමාර්ථ ඉටු වන්නේ සියලු සිසුන්ට පාසල් මට්ටමේ දී මෙම තරග සඳහා ඉදිරිපත්වීමට අවස්ථාව සලසා දුන හොත් පමණක් වන හෙයිනි. එබැවින්,

i. තම පාසලේ සිසුන් අතර මෙම තරග පිළිබඳ උද්‍යෝගයක් ඇති වන අන්දමින්, පළමු ව පන්ති මට්ටමින් (සමාන්තර පන්ති ඇතොත්) තරග පවත්වා විශේෂ සංවිධානයක් යටතේ අවසාන තරග පැවැත්වීමට විදුහල්පති ක්‍රියා කළ යුතු ය.

ii. පාසල් සිසු සම්පත් අනුව යම් තරගයක් පැවැත්විය නොහැකි වේ නම් ඒ ගැන ප්‍රතිඵල සටහනෙහි අදාළ කොටසෙහි සටහන් කළ යුතු ය.

iii. සෑම පාසලක ම සිංහල භාෂා ඒකකයක් විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් පිහිටුවිය යුතු ය. එහි ලේකම් ලෙස සිංහල භාෂා විෂය ප්‍රධාන හෝ සිංහල භාෂා විෂය උගන්වන ගුරුභවතකු යොදා ගත යුතු ය.



Scanned with CamScanner

iv. මෙම තරග ඉසව් අනුව සිංහල විෂය උගන්වන ගුරුභවතුන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී වෙනත් සුදුසු ගුරුවරුන් මෙම ඒකකයේ සාමාජිකයින් ලෙස පත්කර ගත යුතු ය. (භාෂා විෂයය උගන්වන ගුරුවරුන් වීම අවශ්‍ය ම නොවේ.) එම ගුරුවරුන්ට මෙම තරග ඉසව් වෙන වෙන ම ලිඛිතව භාර දී පාසල් මට්ටමේ තරග විධිමත් ව පැවැත්විය යුතු ය. (උදා:- පද්‍ය ගායනා තරගය - සෞන්දර්යය විෂය භාර ගුරුභවතා)

v. තම විදුහලේ තරගයන්හි ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු පත් සිංහල භාෂා ඒකකය භාරයේ සුරැකිව තබා ගත යුතු ය.

vi. අවශ්‍යතාව පරිදි තම විදුහලේ හෝ වෙනත් විදුහලක හෝ ගුරු භවතුන් තරග විනිශ්චය සඳහා යොදවා ගත හැකි ය.

vii. තරග පැවැත්වීමේ සටහන අනුව (පිටු අංක 29) නියමිත දිනයට පෙර අදාළ නිලධාරින් වෙත ලියාපදිංචි තැපෑලෙන් ප්‍රතිඵල යැවීමට හෝ අතින් භාරදීමට හෝ කටයුතු කළ යුතු ය.

viii. කිසියම් තරගක දී යම් ශිෂ්‍යයකුට අසාධාරණයක් සිදුවිණැ'යි යන චෝදනා නැගීමට නොහැකි වන සේ විනිවිදභාවයකින් මෙම තරග පැවැත්විය යුතු ය.

ix. ප්‍රතිඵල සටහනෙහි ජයග්‍රාහකයාගේ නම, පාසලේ ලිපිනය ආදිය ඉතා පැහැදිලිව හා නිවැරදිව ලිවීම අවශ්‍ය ය.

x. ඉහත ජයග්‍රාහක නාම ලේඛන, තරග අවසානයේ දී ප්‍රදර්ශනය කළ යුතු ය. මාර්තු මස 02 වැනි දිනට යෙදෙන කුමාරතුංග මුනිදස සමරු දිනය පාදක කර ගෙන මෙම සිසුන්ට ත්‍යාග සහ සහතිකපත්‍ර ප්‍රදානය කිරීම පාසලේ සිංහල භාෂා ඒකකය මගින් ඉටු කළ යුතු අතර, එම උත්සවයේ වාර්තාවක් විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ සිංහල භාෂා ඒකකයට එවිය යුතු ය.

xi. මෙම සියලු ම තරග අධීක්ෂණය හා මෙහෙයවීම කලාපයේ, පළාතේ සිංහල විෂය භාර නිලධාරින්ගේ වගකීම වේ.



Scanned with CamScanner

5. කලාප තරග (මැයි 30 ට පෙර)

i. පාසල් තරගවල ප්‍රතිඵල අනුව තම කලාපයේ සියලු ම පාසල්වල 1,2 ස්ථාන ලබාගත් සිසුන් ඒ ඒ තරගවලට අනිවාර්යයෙන් ඇතුළත් කර ගත යුතු ය. වාචික තරග එක් ස්ථානයක පැවැත්විය යුතු අතර ලිඛිත තරග එක ස්ථානයක හෝ අවශ්‍ය නම් පමණක් කිහිප තැනක පැවැත්විය හැකි ය. තරග විනිශ්චය සඳහා ආසන්න කොට්ඨාසයක, කලාපයක සිංහල භාෂා ගුරු උපදේශකරුවරුන් හෝ වෙනත් කොට්ඨාසයක, කලාපයක යෝග්‍ය ජ්‍යෙෂ්ඨ ගුරු භවතුන් හෝ යොදගත හැකි ය.

ii. කලාප මට්ටමේ ලිඛිත තරග සඳහා අදළ ප්‍රශ්න පත්‍ර 2019 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ සිංහල භාෂා ඒකකය මගින් සකස් කර පළාත් විෂය සම්බන්ධීකරණ නිලධාරි වෙත ලබා දෙනු ඇත. එම ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර දිය යුතු ය.

iii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ පෞද්ගලික අවධානය යටතේ කලාපයේ සිංහල භාෂා විෂය භාර නිලධාරිවරයා (නි.අ.අ./ස.අ.අ.) සිංහල භාෂා ඒකකය හා සිංහල භාෂා ගුරු උපදේශකවරුන්ගේ සහාය ඇතිව මනා සංවිධානයකින් මෙම තරග පැවැත්විය යුතු අතර කිසිදු අසාධාරණයක් පිළිබඳ පැමිණිල්ලකට ඉඩ නොතැබිය යුතු ය.

6. පළාත් තරග (සැප්තැම්බර් 15ට පෙර)

i. තම පළාතට අයත් එක් එක් කලාපයන්හි ඒ ඒ තරග වර්ගවලින් පළමුවන, දෙවන ස්ථාන දිනාගත් සිසුන් පමණක් පළාත් තරගවලට ඇතුළත් කර ගත යුතු ය.

ii. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික අවධානය යටතේ පළාතේ සිංහල භාෂා විෂය භාර නිලධාරිවරයා (නි.අ.අ./ස.අ.අ) සිංහල භාෂා ඒකකය හා සිංහල භාෂා ගුරු උපදේශකවරුන්ගේ සහාය ඇතිව මනා සංවිධානයකින් මෙම තරග පැවැත්විය යුතු අතර කිසිදු අසාධාරණයක් පිළිබඳ පැමිණිල්ලකට ඉඩ නොතැබිය යුතු ය.

iii. අපක්ෂපාතී විනිශ්චය මණ්ඩලයක් යොද ගෙන මෙම කාර්යය විනිවිදභාවයකින් කළ යුතු ය.
(අත්දැකීම් සහිත විශ්‍රාමික නිලධාරින් ද යොද ගත හැකි ය).

7. සමස්ත ලංකා ජාතික තරග (ඔක්තෝබර් 30 ට පෙර)

i. සමස්ත ලංකා තරග සඳහා පළාත් මට්ටමේ 1,2 ස්ථාන දිනාගත් සිසුන්ගේ නම් පමණක් ඇතුළත් කර චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතිය අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද නිල ප්‍රතිඵල ලේඛනයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවට එවිය යුතු වේ. **පළාත් මට්ටමේ තුන්වන ස්ථානය හිමි කරගත් තරගකරුවන් සමස්ත ලංකා තරගය සඳහා කිසිදු හේතුවක් මත සහභාගි නොකළ යුතු ය.**

ii. පළාත් මට්ටමින් 1,2 ස්ථාන දිනාගත් සිසුන් පමණක් සමස්ත ලංකා තරග සඳහා සහභාගී කර ගැනෙන අතර, ජාතික මට්ටමේ තරග සඳහා සමස්ත ලංකා තරගයන්හි දී පාසල් වර්ග අනුව පළමු වන ස්ථාන දිනාගත් සිසුන් පමණක් සහභාගී කරගනු ලැබේ.

iii. ලිඛිත තරගයන්හි සමස්ත ලංකා ජයග්‍රහණ කලාප මට්ටමින් 1,2 ස්ථාන දිනාගත් සිසුන් සඳහා එම පළාතේ ම මධ්‍යස්ථානයක දී අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන පොදු ලිඛිත විභාගයක් මගින් තීරණය කෙරේ. සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ තීරණය කරනුයේ ද ජාතික මට්ටමේ ජයග්‍රහණ තීරණය කරනුයේ ද එම පිළිතුරු පත්‍ර නැවත ඇගයීමෙනි.

iv. කථික, කියවීම සහ පද්‍ය ගායනා යන වාචික තරගවල පළාත් මට්ටමේ 1,2 ස්ථාන දිනාගත් සිසුන් සඳහා සමස්ත ලංකා හා ජාතික මට්ටමේ තරග අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ, සිංහල භාෂා ඒකකයේ මෙහෙයවීමෙන් පවත්වනු ලැබේ.

v. කෙටි නාට්‍ය පිටපත් ද කෙටි කතා ද ගේය පද රචනා ද අදාළ පළාතේ දී විනිශ්චයට ලක් කරනු ලැබේ. එම ඉසව්වලින් 1,2 ස්ථාන ලබා ගත් පිළිතුරු පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ සිංහල භාෂා ඒකකයේ මෙහෙයවීමෙන් නැවත ඇගයීමට ලක් කොට සමස්ත ලංකා හා ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.



Scanned with CamScanner

# 01. ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

## 01.1 අභිමතාර්ථ

1. මෘතාකාවට අදාළව සංගතතාවෙන් යුක්තව අදහස් පෙළ ගැස්වීමේ හැකියාව වර්ධනය කිරීම.
2. එදිනෙදා ජීවිතයට වැදගත් වන ලේඛන කුසලතා වර්ධනය කිරීම.
3. භාෂා රීතින් අනුගමනය කරමින් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව දියුණු කිරීම.
4. විවිධ රචනා ශෛලීන් හැඳින ගැනීම හා භාවිත හැකියා වර්ධනයට අවස්ථා සලසා දීම.

## 01.2 තරග කොන්දේසි

1. මෙම තරගය 6 සිට 12/13 තෙක් සියලු ම ශ්‍රේණි සඳහා ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.
2. දෙනු ලබන ව්‍යුහගත මාතෘකාවලින් එකක් තෝරාගෙන ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව රචනය ලිවිය යුතු ය. සියලු ශ්‍රේණිවලට මේ සඳහා ලකුණු 40ක් ලැබෙයි.
3. ප්‍රායෝගික ලේඛන කොටස් තුනකින් යුක්ත ය. දී ඇති ප්‍රශ්න අතුරෙන් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු ය.
4. අක්ෂර වින්‍යාසය, පද බෙදීම, ඡේද වෙන් කිරීම, විරාම ලක්ෂණ සැලකිල්ලට ගෙන නිරවුල්ව හා ව්‍යාකරණානුකූලව පැහැදිලි අත් අකුරින් රචනය ලිවිය යුතු ය.
5. කාලය 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා පැය 2කි. 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පැය 3කි.



Scanned with CamScanner

# 01. ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

## 1 කොටස

ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය

01.3 පහත දැක්වෙන තේමාවන්ට අදාළ ලෙස මාතෘකා යොදා ගත හැකි ය. මෙයට අමතරව කාලීන තේමාවන් ද තෝරා ගත හැකි ය.

| ශ්‍රේණිය | වචන සංඛ්‍යාව | රචනා තේමා |
|---|---|---|
| 6, 7 | 150-200 අතර | 1. පරිසර සංරක්ෂණය<br>2. දෙස, බස, රැස නැංවූ ලක් විරුවෝ<br>3. පොත් පත් කියවීම<br>4. ජන සාහිත්‍යය |
| 8, 9 | 250-300ට නො අඩු | 5. ජාතික සම්පත්<br>6. ජාතික උත්සව<br>7. විද්‍යාව හා තාක්ෂණය<br>8. සන්නිවේදනය<br>9. යහපත් සෞඛ්‍යය<br>10. ස්වාභාවික විපත්<br>11. සාරධර්ම |
| 10, 11 | 350-400ට නො අඩු | 1. සාමය<br>2. ආපදා කළමනාකරණය<br>3. සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය<br>4. විද්‍යාව හා තාක්ෂණය<br>5. සංස්කෘතික දායාද<br>6. ජන සාහිත්‍යය<br>7. තරුණ පරපුර |
| 12, 13 | 450 -500ට නො අඩු | 8. ජාත්‍යන්තර සම්බන්ධතා හා අභියෝග<br>9. සම්භාව්‍ය සාහිත්‍යය<br>10. ස්වාභාවික සම්පත් සංරක්ෂණය<br>11. භාෂා අධ්‍යයනය<br>12. ආර්ථික සංවර්ධනය<br>13. ජීවිතය හා සෞන්දර්යය<br>14. වෘත්තීය සංවර්ධනය<br>15. පුරාවස්තු සංරක්ෂණය |



Scanned with CamScanner

01.4 ගද්‍ය රචනා සඳහා ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| අ | මාතෘකාවට අදාළ සාරවත් අදහස් (අන්තර්ගතය) | 15 |
| ආ | භාෂා රීතීන් අනුගමනය (උක්තාඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය) | 10 |
| ඇ | ශිල්පීය දක්ෂතා (පද බෙදීම, ඡේද වෙන් කිරීම, විරාම ලක්ෂණ හා අත් අකුරු) | 05 |
| ඈ | ප්‍රකාශන ශක්තිය හා සමස්ත අගය | 10 |
| | මුළු ලකුණු | 40 |

## 2 කොටස

(අ) කොටසින් එක් ප්‍රශ්නයක් ද, (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් ද (ඉ) කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරා ගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු ය. තෝරා ගැනීම සඳහා ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කෙරේ.

| ශ්‍රේණිය | නියමිත ප්‍රායෝගික ලේඛන |
|---|---|
| 6, 7, 8, 9 | (අ) කොටස<br>1. පෞද්ගලික ලිපියක්<br>2. රාජකාරි ලිපියක් / ව්‍යාපාරික ලිපියක්<br>(ආ) කොටස<br>1. දැන්වීමක්<br>2. සිද්ධියක් ඇසුරෙන් පුවත්පත් වාර්තාවක්<br>(ඉ) කොටස<br>1. සුබපැතුම් පතක්<br>2. ආරාධනා පත්‍රයක්<br>3. පෝස්ටරයක් හා දැන්වීමක් |
| 10,11,12/13 | (අ) කොටස<br>1. රාජකාරි ලිපියක්<br>2. ව්‍යාපාරික ලිපියක්<br>(ආ) කොටස<br>1. රැස්වීමක්/සිද්ධියක්/සාකච්ඡාවක් ඇසුරෙන් පුවත්පත් වාර්තාවක්<br>2. ආකෘති පත්‍රයක්<br>3. න්‍යාය පත්‍රයක්<br>4. බිත්ති පුවත්පතකට ලිපියක්<br>(ඉ) කොටස<br>1. අත් පත්‍රිකා<br>2. දැන්වීමක් |



Scanned with CamScanner

ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| (අ) | ආකෘතිය | 05 |
| (ආ) | අන්තර්ගතය | 08 |
| (ඇ) | වියරණ විධි | 05 |
| (ඈ) | ශිල්පීය දක්ෂතා | 02 |
| | මුළු එකතුව | 20 |

- ප්‍රායෝගික ලේඛන 03ට ලකුණු 20 × 3 = 60ය

1.5 පරිශීලනීය ග්‍රන්ථ

1. ලියන කලාව - බඹරැන්දේ සිරිසීවලී හිමි
2. සිංහල ශෛලිය - බඹරැන්දේ සිරිසීවලී හිමි
3. ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස මහතා
4. ප්‍රබන්ධ සංග්‍රහය - කුමාරතුංග මුනිදාස මහතා
5. හොඳ සිංහල - රැයිපියෙල් තෙන්නකෝන් මහතා
6. සිංහල භාෂාව හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු මහතා
7. පදය, වාක්‍යය හා ඡේදය - මහාචාර්ය විනී විතාරණ මහතා
8. 6, 7, 8 සිංහල රචනා - සිරිසේන විතානගේ මහතා

- අදාළ ශ්‍රේණි සඳහා වන සිංහල පෙළපොත් පරිශීලනය කිරීම අනිවාර්ය වේ.

## 02. පද්‍ය නිර්මාණය හා අවබෝධය

02. 1 අභිමතාර්ථ

1. පද්‍යකරණයට නැඹුරු කිරීම
2. පද්‍ය නිර්මාණ කුසලතා වර්ධනය කිරීම
3. පද්‍ය රසාස්වාදන කුසලතා වර්ධනය කිරීම
4. පද්‍ය නිර්මාණයට අවශ්‍ය ශාස්ත්‍රීය මූලධර්ම ගැන දැනීම ලබා ගැනීමට පෙලඹවීම

02. 2 තරග කොන්දේසි

1. මෙම තරගය 6 සිට 12/13 තෙක් සියලු ම ශ්‍රේණි සඳහා පැවැත්වේ.
2. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය. ප්‍රශ්න පත්‍රයේ 1 කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. දෙවන කොටසේ තේමාවලින් එක් තේමාවක් යටතේ කාව්‍ය නිර්මාණයක් කර සුදුසු මාතෘකාවක් යෙදිය යුතු ය.



Scanned with CamScanner

3. පද්‍ය රචනය සඳැස් හෝ නිසඳැස්/ නිදහස් හෝ විය යුතු ය.
4. ස්වනිර්මාණ විය යුතු ය.
5. සඳැස් පද්‍ය කවි 6 - 8 වඩා නො වැඩි විය යුතු ය. නිසඳැස් නිර්මාණය පේළි 25 - 30කට නො වැඩි විය යුතු ය.
   කාලය පැය 02කි.

02. 3 ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය

**I කොටස**

(අ) 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා පහත දැක්වෙන කරුණු ඇතුළත් වන සේ ප්‍රශ්න සකස් කරනු ලැබේ.

1. ප්‍රශ්න පත්‍රයෙහි දී ඇති චිත්‍රයක් හෝ ඡායාරූපයක් නිරීක්ෂණය කොට පද්‍ය පන්තියක් නිර්මාණය කිරීම
2. දෙනු ලබන පද්‍යයන්හි ඌන පද සම්පූර්ණ කිරීම
3. දෙනු ලබන කවි පැනවලට කවියෙන් ම පිළිතුරු සැපයීම
4. කාව්‍යමය රචනෝපක්‍රම හැඳිනගෙන භාවිත කිරීම

(ආ) 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පහත දැක්වෙන කරුණු ඇතුළත් වන සේ ප්‍රශ්න සකස් කරනු ලැබේ.

1. සිංහල ඡන්දස් අලංකාර ගැන ලියැවුණු පැරණි පොත් සම්බන්ධ සාමාන්‍ය දැනීම
2. සමුද්‍රඝෝෂ, පෙද, මහ පියුම්, ගී විරිත් පිළිබඳ අවබෝධය
3. දීපක, උපමා, රූපක, අතිශයෝක්ති, එළිසමය, අනුප්‍රාස යන කාව්‍ය අලංකාර, අර්ථ රසය හා ශබ්ද රසය පිළිබඳ සාමාන්‍ය දැනීම
4. සපයනු ලබන චිත්‍රයක් හෝ ඡායාරූපයක් නිරීක්ෂණය කොට පද්‍ය පන්තියක් නිර්මාණය කිරීම
5. දෙනු ලබන පද්‍යයන්හි ඌන පද සම්පූර්ණ කිරීම
6. දෙනු ලබන කවි පැනයනට එම විරිතෙන් ම කවියෙන් පිළිතුරු සැපයීම
7. කාව්‍යමය රචනෝපක්‍රම හැඳිනගෙන භාවිත කිරීම



Scanned with CamScanner

## II කොටස

(අ), (ආ) යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. පිළිතුරු ලිවිය යුත්තේ එක් කොටසකට පමණි

(අ) දී ඇති තේමා අතුරෙන් එක් තේමාවක් තෝරා ගෙන කාව්‍ය නිර්මාණය කිරීම

(ආ) කාලීන මාතෘකා ඇසුරෙන් කාව්‍ය නිර්මාණය කිරීම

6, 7, 8, 9 ශ්‍රේණි සඳහා දෙනු ලබන තේමා

උදාඃ- කවියෙන් ලිපි/ පිළිතුරු ලිපි, සංවාද, කවිකතා, කවිදෙසුම් හෝ දී ඇති විස්තරය කියවා කාව්‍ය නිර්මාණය කිරීම

10, 11, 12/13 ශ්‍රේණි සඳහා දෙනු ලබන තේමා

උදාඃ- කවියෙන් ලිපි/ පිළිතුරු ලිපි, සංවාද දී ඇති විස්තරය කියවා කාව්‍ය නිර්මාණය කිරීම

2.3 ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| පළමු කොටසට | ලකුණු | 50 |
| දෙවන කොටසට | ලකුණු | 50 |
| | මුළු ලකුණු | 100 |

II කොටසට ලකුණු දෙන ආකාරය

| | | |
|---|---|---|
| කාව්‍ය අන්තර්ගතය | ලකුණු | 15 |
| නිර්මාණ ශක්තිය | ලකුණු | 10 |
| කාව්‍යමය භාෂාව | ලකුණු | 10 |
| උචිත මාතෘකාව | ලකුණු | 05 |
| සමස්ත අගය | ලකුණු | 10 |
| | මුළු ලකුණු | 50 |

2.4 පරිශීලනීය ග්‍රන්ථ

1. සිදත් සඟරාව - (ඉටු අනිටු අදියර හා ලකර අදියර)
2. විරිත් වැකිය - කුමාරතුංග මුනිදාස මහතා
3. සාහිත්‍යය - හේන්පිටගෙදර ඤාණසීහ හිමි
4. කව් රස විඳීම - මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා
5. සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු මහතා



Scanned with CamScanner

6. සිංහල භාෂාව - තියඩෝර් ජී. පෙරේරා පියතුමා
7. සාහිත්‍ය විද්‍යාව - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
8. කල්පනා ලෝකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
9. කාව්‍ය නිර්මාණයට පෙර හුරුවක් - ටී. බී. සිලෝගම මහතා

- අදාළ ශ්‍රේණි සඳහා වන පෙළපොත් පරිශීලනය කිරීම සුදුසු ය.

## 03. භාෂා භාවිතය හා අවබෝධය

03.1 අභිමතාර්ථ

1. සිංහල භාෂාවේ සම්මත ව්‍යාකරණ විධි පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම
2. භාෂා අවබෝධය හා භාවිත හැකියාව දියුණු කිරීම
3. සාරාංශකරණය පිළිබඳ ශක්‍යතා වැඩි දියුණු කිරීම

03.2 තරග කොන්දේසි

1. ප්‍රශ්න පත්‍රය 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා කොටස් දෙකකින් ද 10, 11, 12/13 ශ්‍රේණි සඳහා කොටස් තුනකින් ද යුත් ලිඛිත පරීක්ෂණයකි.
2. I කොටස යටතේ භාෂා භාවිතය පිළිබඳ දැනුම හා හැකියාව විමසන කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. එම ප්‍රශ්න ඒ ඒ ශ්‍රේණියට නියමිත පෙළපොත් ඇසුරෙන් සකස් වේ.
3. II කොටස යටතේ, අවබෝධය හා භාෂා කුසලතා මැනෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
4. III කොටස යටතේ, දෙනු ලබන ඡේදය සාරාංශ කර දැක්විය යුතු ය. මේ කොටස 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පමණක් අදාළ වේ.
5. අවබෝධය සඳහා තෝරාගන්නා ඡේද ගද්‍ය, පද්‍ය කොටස් දෙකකින් යුක්ත ය.
6. කාලය 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා පැය 02කි. 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පැය 03කි.

3.3 ලකුණු ක්‍රමය

- 6, 7, 8,. 9 ශ්‍රේණි සඳහා

| | | |
|---|---|---|
| භාෂා භාවිතය I කොටස | ලකුණු | 60 |
| අවබෝධය (ගද්‍ය, පද්‍ය) II කොටස | ලකුණු | 40 |
| | මුළු ලකුණු | 100 |



Scanned with CamScanner

- 10, 11, 12/13 ශ්‍රේණි සඳහා

| | | |
|---|---|---|
| භාෂා භාවිතය I කොටස | ලකුණු | 40 |
| අවබෝධය (ගද්‍ය, පද්‍ය) II කොටස | ලකුණු | 40 |
| සාරාංශය III කොටස | ලකුණු | 20 |
| | මුළු ලකුණු | 100 |

3.4 පරිශීලනීය ග්‍රන්ථ :

1. බසක මහිම පොත් පෙළ - මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා
2. සිංහල ව්‍යාකරණ - මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක මහතා
3. භාෂාව හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබඳු මහතා
4. සිංහල ව්‍යාකරණ - පී. රූපසිංහ පෙරේරා මහතා
5. පද නීතිය - වේරගම පුංචිබණ්ඩාර පඬිතුමා - සංස්කරණය ටී. බී. සිලෝගම මහතා
6. සාමාන්‍ය පෙළ සරල සිංහල භාෂා භාවිතය - සිරිසේන විතානගේ මහතා

- අදාළ ශ්‍රේණි සඳහා වන පෙළපොත් පරිශීලනය කිරීම සුදුසු ය.

## 04. සාහිත්‍ය දැනුම මිනුම

04.1 අභිමතාර්ථ

1. චිරන්තන හා අද්‍යතන සාහිත්‍යය පිළිබඳ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම.
2. රසාස්වාදය හා සාහිත්‍ය විචාර හැකියා වර්ධනය කිරීම.
3. ස්මරණය, චින්තනය, වින්දනය හා ප්‍රකාශන ශක්තිය වර්ධනය කිරීම.

04.2 තරග කොන්දේසි

1. 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා නියමිත පෙළපොත්වල පාඩම් ඇසුරෙන් ද, ඊට පරිබාහිර ව සාහිත්‍යමය පොදු කරුණු ඇසුරෙන් ද පැරණි සාහිත්‍ය කෘති ඇසුරෙන් ද ප්‍රශ්න සකස් කෙරේ.
2. 10, 11, 12, 13 ශ්‍රේණි සඳහා නියමිත සිංහල පෙළපොත් ද චිරන්තන, අද්‍යතන ගද්‍ය පද්‍ය ද විශ්ව සාහිත්‍යය ද ඇසුරෙන් ප්‍රශ්න සකස් කෙරේ.



Scanned with CamScanner

(අ) චිරන්තන සාහිත්‍යය යටතේ ඒ ඒ සාහිත්‍ය යුගවල දී ලියවුණු කෘතීන්, ඒවායේ අන්තර්ගතය, කතුවරුන් හා වකවානු පිළිබඳ දැනුම විමසනු ලැබේ.

(ආ) අද්‍යතන සාහිත්‍ය කෘති යටතේ කෙටිකතා, නවකතා, පද්‍ය, ගීත නාට්‍ය හා සිනමාව වැනි සාහිත්‍යාංග පිළිබඳව විමසනු ලැබේ.

(ඇ) චිරන්තන සාහිත්‍යයට අයත් ගද්‍ය පද්‍ය කොටස් ලිහිල් බසින් ලිවීම පිළිබඳ ප්‍රශ්න ඇතුළත් කෙරේ.

(ඈ) සාහිත්‍ය රසාස්වාදය හා විචාරයට අදාළ මූලධර්ම පිළිබඳ සරල ප්‍රශ්න ද සාහිත්‍ය රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව මැන බැලෙන ප්‍රශ්න ද ඇතුළත් කෙරේ.

(ඉ) 6 - 11 ශ්‍රේණි සඳහා නියමිත පෙළපොත් ඇසුරෙන් අවස්ථා සම්බන්ධය විමසන ප්‍රශ්න ඇතුළත් කෙරේ.

(ඊ) සෑම ප්‍රශ්න පත්‍රයක ම ප්‍රශ්න 10ක් අඩංගු වේ. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

3. කාලය 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා පැය 02කි. 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පැය 03 කි.

රසාස්වාද මූලධර්ම:-
රසභාව, කාව්‍යාලංකාර, කාව්‍යෝක්ති, ව්‍යංග්‍යාර්ථ, ධ්වනිතාර්ථ, ශෛලිය

විචාර මූලධර්ම :-
අනුභූතිය, පරිකල්පනය, ආකෘතිය, ඖචිත්‍යය, අන්තර්ගතය, ශෛලිය, භාෂාව, දෘෂ්ටිය, තර්කානුකූලභාවය, විශ්ලේෂණාත්මක විග්‍රහ

04.3 ලකුණු ක්‍රමය

| ශ්‍රේණිය | ලකුණු |
|---|---|
| 6, 7, 8, 9, 10, 11 ශ්‍රේණි | 100 |
| 10, 11, 12/13 ශ්‍රේණි | 100 |

4.4 පරිශීලනීය ග්‍රන්ථ

1. සිංහල සාහිත්‍ය වංශය - මහාචාර්ය පී. බී. සන්නස්ගල මහතා
2. සිංහල සාහිත්‍ය කථා I, II, III - මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි
3. නිර්මාණය හා විචාරය - මහාචාර්ය විමල් දිසානායක මහතා
4. සිංහල සාහිත්‍යය I, II, III - මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතා
5. සාහිත්‍යය - පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ හිමි
6. සාහිත්‍ය විද්‍යාව - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා



Scanned with CamScanner

7. නව පද්‍ය සිංහලය - මාර්ටින් වික්‍රමසිංහ මහතා
8. සාහිත්‍ය විචාර කලාව - ධර්මසිරි ඒකනායක මහතා
9. සාහිත්‍ය විචාර ප්‍රදීපිකා - මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා
10. විශ්ව සාහිත්‍යය - මහාචාර්ය මිණිවන් පී. තිලකරත්න මහතා
බී. එන්. ජිනසේන මහතා

## 05. අත් අකුරු භාෂාවේ ශිල්පීය ක්‍රම

05.1 අභිමතාර්ථ:

1. අත් අකුරු පිරිපුන් බවෙන් හා සම්මත හැඩයෙන් යුක්තව ලිවීම
2. නිවැරැදිව අක්ෂර වින්‍යාස භාවිතය
3. විරාම ලක්ෂණ උචිත ස්ථානවල නිවැරැදිව යෙදීම
4. පිළිගත් සම්ප්‍රදාය අනුව පද බෙදීම
5. නියමිත කාලය තුළ වැඩි වාර ගණනක් ලිවීම

05.2 තරග කොන්දේසි

1. මෙම තරගය 6, 7, 8, 9,10 සහ 11, ශ්‍රේණි සඳහා පමණක් පැවැත්වේ.
2. ඒ ඒ ශ්‍රේණියට නියමිත පෙළපොතෙන් හෝ පැරණි ගද්‍ය සාහිත්‍ය කෘතියකින් හෝ උපුටා දෙනු ලබන අවිධිමත් ව ලියන ලද ඡේදයක් විනාඩි 30ක කාලයක් තුළ ශෝභන සම්මත හැඩයෙන් යුත් අකුරුවලින් විධිමත් ව දස වාරයක් පිටපත් කළ යුතු ය.
3. පාසල් මට්ටමේ දී ඉහත ඡේදයට අමතරව කියවන විට ලිවීමක් ද දිය යුතු ය.
4. නිවැරදි අකුරු ලිවීමේ දැනුම හැකියා විමසා බැලෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු ය.
5. විරාම ලක්ෂණ, අක්ෂර වින්‍යාසය හා පද බෙදීම ගැන සැලකිලිමත් විය යුතු ය.

කාලය පැය 02කි.

05.3 ලකුණු ක්‍රමය

| | |
|---|---|
| • අකුරු සම්මත හැඩයෙන් යුතුව ලිවීම | 20 |
| • නිවැරදි අක්ෂර වින්‍යාසය | 10 |
| • විරාම ලක්ෂණ නිවැරැදිව යෙදීම | 05 |
| • පද බෙදීම | 05 |
| • දස වාරයක් ලිවීම (එක් වාරයකට ලකුණු 1 බැගින්) | 10 |
| • නිවැරැදි අකුරු ලිවීම ආශ්‍රිතව විමසනු ලබන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයීම | 50 |
| මුළු ලකුණු | 100 |



Scanned with CamScanner

05.4 ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය

1. 6 සිට 11 තෙක් ශ්‍රේණි සඳහා පහත දැක්වෙන ඡේදය වැනි වැරදි අක්ෂර වින්‍යාසයත් හා වැරදි ව්‍යාකරණවලින් යුත් ඡේදයක් දීම
2. 6-9 දක්වා ශ්‍රේණි සඳහා ඡේදයේ මුද්‍රිත පේළි 8-10ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.
3. 10 -11 ශ්‍රේණි සඳහා පේළි 10-15ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.

උදාහරණය
එවිටරජ්ජුරුවෝසමාධිවමාඇස්හමුයේමොහුගේරාජ්‍යශ්‍රීයදකිමියිසිතාරාජ්‍යශ්‍රීය දුන්නාහඑකියනරාජකුමාරයෝත්‍රාජ්‍යටපැමිණදිසාපාමොක්ආචාරීන්ටපාට වකරන්නාකැමතිවආචාරීන්වහන්සේමාකෙරේසැකනොසිතාවහාඑන්නේයහපතැ යිකියායවූහඑපවත්දිසාපාමොක්ආචාරීන්වහන්සේඅසාරජ්ජුරුවන්වහන්සේමා කැඳවාඑවන්නේමටස්නේහයෙන්නොවෙයිමාගැසූපාරටනිගීහකරන්නටසිතාදැ නකුමාරයෝබාලයෝයඑසේහෙයින්මාකියනඅවවාදදන්අසන්නෝනොවෙති

4. අත් අකුරු ලිවීම පිළිබඳව අවබෝධය විමසන ප්‍රශ්න කීපයක් විමසීම
5. පාසල් මට්ටමේ දී පෙළපොතෙන් තෝරාගත් මුද්‍රිත පේළි 8-10 ඡේදයක් කියවන විට ලිවීමට සැලැස්වීම.

සිසුන්ගේ අත් අකුරු හා ප්‍රකාශන හැකියාව පිළිබඳව තක්සේරුවක් ලැබිය හැකි පරිදි පාසල් මට්ටමේ දී ඉහත 1-5 අනුව පිළිතුරු ලියවීම ප්‍රමාණවත්ය.

5.5 පරිශීලනීය ග්‍රන්ථ

1. සාක්ෂර ශික්ෂණය - අංකෙළිමැඩිල්ලේ ධම්මරතන හිමි
2. පුරාණ සිංහල අකුරුකරණය - කුමාරතුංග මුනිදාස මහතා
3. ලිවීම හා කියවීම - තෝමස් ග්‍රේ මහතා - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
4. සිංහල ලේඛන රීතිය (2015 සංස්කරණය) - ජාතික අධ්‍යාපන ආයතනය
5. සිංහල ලේඛන ව්‍යවහාරය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා උපදේශ සංග්‍රහය

වැදගත්:- පාසල් මට්ටමේ දී සියලු සිසුන්ගේ අත් අකුරු, පිළිතුරු පත්‍ර අනුව I. සතුටුදායක II. සංවර්ධනය විය යුතු III. සතුටුදායක නොවන ලෙස කාණ්ඩ කොට තබාගත යුතු ය. ඒ අනුව පාසලේ 1, 2 ස්ථාන ලබන සිසුන් දෙදෙනාගේ හා II හා III කාණ්ඩවල සිසුන්ගේ ලේඛනයක් ද වෙන් වෙන් ව සකස් කොට



Scanned with CamScanner

ප්‍රතිඵල සමග කලාප අධ්‍යාපන කාර්යාලයට භාර දිය යුතු ය. මෙම II හා III ලේඛන අනුව කලාප අධ්‍යාපන කාර්යාලය මගින් අත් අකුරු සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු ය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ මෙහෙයවීම මත අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ(සං) සිංහල විෂය සම්බන්ධීකරණ නිලධාරි, ගුරු උපදේශකවරුන් (සිංහල) අදාළ විදුහල්වල විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් 6-11 ශ්‍රේණි අංශ ප්‍රධානීන්/ විෂය සමායෝජකවරුන්, සිංහල විෂය ගුරු භවතුන් නියෝජනය වන කමිටුවකින් ''අත් අකුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය'' ක්‍රියාත්මක කළ යුතු ය. කාලය මාස 06 කි. මෙම කාලසීමාව තුළ අවම වශයෙන් සිවු වතාවක්වත් ඒ ඒ සිසුන් පිළිබඳ ඇගයීමක් කොට ප්‍රගතිය පිළිබඳ වාර්තා තබාගත යුතු ය. ව්‍යාපෘති කාලය අවසානයේ දී සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් සොයා බැලීම මගින් එම කාර්යයේ යෙදුණු ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් ඇගයීම් කිරීම් සඳහා සුදුසු ක්‍රමවේදයක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ මෙහෙයවීමෙන් සැකසිය යුතුවේ. ඒ අනුව පළාත්/ කලාප මට්ටමින් ගුරුභවතුන්/ ගුරු උපදේශකවරුන් ඇගයීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු ය. එම නිර්ණායක ජාතික මට්ටමේ ගුරුභවතුන්/ ගුරු උපදේශකවරුන් ඇගයීම සඳහා නිර්ණායකයක් ලෙස යොදා ගැනීම කළ හැකි ය.

## 06 කෙටි කතා

06.1 අභිමතාර්ථ

1. කෙටිකතා පිළිබඳ අවබෝධය ලැබීම
2. කෙටිකතා නිර්මාණය සඳහා පෙලඹීම
3. නිර්මාණාත්මක කුසලතා හැඳින ගැනීම
4. නිර්මාණ කුසලතා වර්ධනය කිරීම

06.2 තරග කොන්දේසි

1. මෙම තරගය පවත්වනු ලබන්නේ 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පමණි.
2. නිදහසේ ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව දී පාසල් මට්ටමින් හොඳ නිර්මාණ දෙකක් තෝරා එවිය යුතු අතර, එම ජයග්‍රාහී සිසුන් දෙදෙනා කලාප තරග සඳහා ඉදිරිපත් කළ යුතු ය.
3. කලාප මට්ටමේ දී, කලාප මට්ටමින් ලබාදෙනු ලබන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන මග පෙන්වීමට අනුව පැය 3 ක කාලයක දී කෙටි කතාවක් රචනා කළ යුතු ය.

නිදසුන් :

- විහඟ තම තීන්ත පෑන පුපුරා යාම නිසා ඒ වටා ටේප්පටියක් ඔතා ගෙන ලියමින් සිටියේ ය. එය දුටු සිංහල ගුරුතුමා විහඟගේ පෑන ඉල්ලාගෙන පරීක්ෂාකර බලා නැවත විහඟට ලබා දුන්නේ ය. පසුදින සිංහල ගුරුතුමා විහඟ තමා වෙත කැඳවා අලුත් ම පෑනක් තෑගි කරයි.



Scanned with CamScanner

- නොකඩවා ඇද හැලෙන මහා වර්ෂාව නිසා ප්‍රදේශය පුරා ගංවතුර තත්වයක් මතුවෙයි. අවට වෙසෙනෙ ජනයාගේ ජන ජීවිතය තර්ජනයට ලක් වී ඇත. නාරද හා පසිඳු යාබද නිවාස දෙකක දිවි ගෙවන යහළුවෝ වෙති. එදින ඔවුහු පාසල් නොගියහ. ජල පහරට හසුවී ගසාගෙන යන බලු පැටියෙකු ඔවුනගේ ඇස් ගැටෙයි.

06.3 ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | කතා වින්‍යාසය (කතා වස්තුව) අවස්ථා, සිද්ධි, චරිත නිරූපණය හා සන්දර්භයේ යෝග්‍යතාව | 15 |
| 2. | අපූර්වත්වය | 10 |
| 3. | වර්ණනා හා සංකේත භාවිතය | 10 |
| 4. | නිර්මාණාත්මක බස් වහර | 10 |
| 5. | කතාවේ සමස්ත අගය | 05 |
| | මුළු ලකුණු | 50 |

06.4 පරිශීලනීය ග්‍රන්ථ

1. වහල්ලු කෙටිකතා සංග්‍රහයේ ප්‍රස්තාවනාව - මාර්ටින් වික්‍රමසිංහ මහතා
2. කෙටිකතා විචාර මූලධර්ම - මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා
3. නිර්මාණ පසුබිම - මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා
4. කෙටි කතා කලාවේ විකාශනය - මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා
5. කෙටිකතා නිර්මාණාවලෝකන - කීර්ති වැලිසරගේ මහතා

- අදාළ ශ්‍රේණි සඳහා වන පෙළපොත් පරිශීලනය කිරීම සුදුසු ය.

## 07. ගේය පද රචනා

07.1 අභිමතාර්ථ

1. අර්ථවත්වූත්, රසවත්වූත් ගීපදමාලා රචනයට නැඹුරු කිරීම.
2. නිර්මාණ කුසලතා හා රසඥතා වර්ධනය කිරීම.
3. වියත් රචකයන්ගේ ගී පදමාලා පරිශීලනයට යොමු කිරීම.



Scanned with CamScanner

07.2 තරග කොන්දේසි

1. 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පමණක් මෙම තරගය පැවැත්වේ.
2. ගී පදමාලාව ස්වතන්ත්‍ර විය යුතු ය.
3. තමන් කැමති අනුභූතියක් තෝරා ගත හැකි ය.
4. ගී පදමාලාවෙහි සාහිත්‍යමය වටිනාකමක් තිබිය යුතු ය.
5. කේවල/යුගල/සමූහ ගායනයට ගැළපෙන අයුරින් පද මාලා රචනය කළ හැකි ය.
6. නිදහසේ ලියා ඉදිරිපත් කිරීමට කාලය හා අවස්ථාව සිසුන්ට දී පාසල් මට්ටමින් හොඳ ම නිර්මාණ 3ක් තෝරා ගත යුතු ය. මෙය විෂය භාර ගුරුවරයා හා විදුහල්පතිවරයා විසින් ශිෂ්‍යයාගේ නිර්මාණයක් බවට සහතික කොට විදුහල්පතිවරයාගේ නිල මුද්‍රාව යෙදිය යුතුවේ. කලාප, පළාත්, සමස්ත ලංකා තරග සඳහා 1, 2 ස්ථාන ලබා ගත් නිර්මාණ පමණක් ඉදිරිපත් කළ යුතු ය.

07.3 ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| • තෝරාගත් අනුභූතිය, අපූර්වත්වයෙන් දැක්වීම | ලකුණු | 10 |
| • පදමාලාවේ අර්ථවත්භාවය හා රසවත් බව | ලකුණු | 10 |
| • උචිත උපමා, රූපක ආදී අලංකාර භාවිතය | ලකුණු | 10 |
| • කාව්‍යෝචිත ආකෘති, ගීතමය භාෂාව අනුප්‍රාසය ආදී ශබ්දාලංකාර භාවිතය | ලකුණු | 10 |
| • ගීයෙන් ධ්වනිත වන පණිවුඩයේ අගය | ලකුණු | 10 |
| | මුළු ලකුණු | 50 |

07.4 පරිශීලනීය ග්‍රන්ථ

1. හෙළමියැසිය - කුමාරතුංග මුනිදාස මහතා
2. කෝමළ රේඛා - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා
3. රත්නාවලී නාට්‍ය ගීත සංග්‍රහය - පියදාස නිශ්ශංක මහතා/ ජයන්ත අරවින්ද මහතා
4. ගීතය හා කවිය - ඩබ්ලියු. ඒ. අබේසිංහ මහතා



Scanned with CamScanner

# 08. කෙටි නාට්‍ය පිටපත්

08.1 අභිමතාර්ථ

1. ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා මතු කර ගත හැකි කතා වස්තුවක් තෝරා ගැනීම.
2. කතා වස්තුවේ නිර්මාණාත්මක නාට්‍යමය අවස්ථා ඇසුරෙන් නාට්‍ය පෙළ ලිවීම.
3. අවස්ථා, සිද්ධි අපූර්වත්වයෙන් නිරූපණය කිරීමේ හැකියා වර්ධනය කිරීම.

08.2 තරග කොන්දේසි

1. මෙම තරගය 10, 11, 12/13 ශ්‍රේණි සඳහා පමණක් පැවැත්වේ.
2. නිදහස්ව ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ.
3. පාසල් මට්ටමින් 1,2,3 ස්ථාන තෝරා ගත යුතු අතර, එයින් 1,2 ස්ථාන පළාත් තරග සඳහා ඉදිරිපත් කළ යුතු ය. පළාත් මට්ටමින් 1,2 ස්ථාන සමස්ත ලංකා මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කළ යුතු ය.
4. උචිත බස් වහරකින් ශෛලිගත, අර්ධ ශෛලිගත, ස්වාභාවික හා ගීත නාටක යන කවර සම්ප්‍රදාය වුව ද නිර්මාණය කළ යුතු ය.
5. මෙම නාට්‍ය පිටපත විනාඩි 15ක කාලසීමාවක් තුළ වේදිකා ගත කර අවසන් කළ හැකි විය යුතු ය.
6. නාට්‍යෝචිත අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.
7. නාට්‍ය අත් පිටපත තනි පිටුවල පමණක් පැහැදිලි අත් අකුරින් ලිවිය යුතු ය.

08.3 ලකුණු ක්‍රමය

ලකුණු 10

| | | |
|---|---|---|
| තේමාවට අනුව නාට්‍ය ගොඩනැගීම | ලකුණු | 10 |
| නාට්‍යෝචිත වස්තුවක් තෝරා ගැනීම | ලකුණු | 15 |
| චරිත, සිද්ධි, අවස්ථා නිරූපණය | ලකුණු | 10 |
| භාෂාව උපයෝගී කර ගන්නා ආකාරය | ලකුණු | 10 |
| සමස්ත නිමාව | ලකුණු | 05 |
| මුළු ලකුණු | | 50 |

08.4 පරිශීලනීය ග්‍රන්ථ

1 වෙස් මුහුණු ද සැබෑ මුහුණු ද - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර



Scanned with CamScanner

# 09. කථික

09.1 අභිමතාර්ථ

1. වාග් චාතුර්යය, විවිධ ක්ෂේත්‍ර යටතේ දැනුම රැස්කිරීමේ රුචිය, තර්කනය හා අදහස් ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම
2. හඬ පාලනය, උචිත අංග චලනය භාවිත කිරීමේ කුසලතාව වර්ධනය කිරීම
3. නියමිත කාලයක දී ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම

09.2 තරග කොන්දේසි

1. පැහැදිලි නිරවද්‍ය උච්චාරණය ගැනත් අවස්ථෝචිත අංග චලනය හඬ පාලනය ගැනත් අවධානය යොමු කළ යුතු ය.
2. මෙම තරග 6, 7, 8, 9, 10, 11, 12/13 යන සියලු ශ්‍රේණි සඳහා පැවැත්වේ.
3. සෑම කථිකයකුට ම විනාඩි 05ක පෙර සූදානමකට ඉඩ ලැබෙන අතර කථාව ද විනාඩි 05කට සීමා කෙරේ.
4. තෝරාගත් මාතෘකා දෙකින් එක් මාතෘකාවක් යටතේ කථා කළ යුතු ය.

සටහන් - එක් තරගකරුවෙකු කථා කළ මාතෘකාව තවත් තරගකරුවෙකුට ලබා නොදීමට විනිශ්චය මණ්ඩලය වග බලා ගත යුතු ය.

5. ජාතික මට්ටම දක්වා උපයෝගී කරගන්නා තේමා පහත දක්වේ. එම තේමා යටතේ විවිධ මාතෘකා තරග සංවිධායකයින් විසින් සකස් කළ යුතු ය.

09.3 තරග තේමා

6 සිට 9 ශ්‍රේණි සඳහා තේමා

1. පාසල
2. වැඩිහිටියෝ
3. සාමය
4. පරිසරය
5. පොදු දේපළ
6. සාරධර්ම
7. ළමා පරපුර
8. සාහිත්‍යය
9. ස්වාභාවික සම්පත්
10. ජාතික වීරවරයෝ
11. විදුලි බලය
12. ඉගෙනීම



Scanned with CamScanner

10,11, 12/13 ශ්‍රේණි සඳහා තේමා

1. යුතුකම් හා අයිතිවාසිකම්
2. සාහිත්‍යය
3. සංස්කෘතික උරුම
4. නව සංවර්ධන ප්‍රවණතා
5. සාමය හා සහජීවනය
6. ගෝලීයකරණය
7. විදේශ සම්බන්ධතා
8. මත් උවදුර
9. සැමට අධ්‍යාපනය
10. ජන වාර්ගික සමගිය
11. පරිසරය
12. නීතිය හා සාමය
13. සාරධර්ම
14. විද්‍යාව හා තාක්ෂණය
15. ජාතිකාභිමානය
16. සෞඛ්‍යය
17. මාර්ග අනතුරු
18. මානව හිමිකම්
19. ස්වාභාවික විපත්
20. ජනසන්නිවේදන මාධ්‍ය

උදා : තේමාව - ජනසන්නිවේදන මාධ්‍ය

අනු මාතෘකා -
1. වර්තමාන ලෝකය හා ජනසන්නිවේදනය
2. ජනසන්නිවේදන මාධ්‍ය හා සාරධර්ම
3. පුවත්පතක වගකීම
4. රූපවාහිනිය හා ළමා පරපුර
5. විද්‍යුත් මාධ්‍ය හා අධ්‍යාපනය

ඉහත දක්වා ඇත්තේ උදාහරණ පමණි. මෙම තේමාවට අනුව තව තවත් අනු මාතෘකා සකස් කරගත හැකි ය.



Scanned with CamScanner

09.4 ලකුණු ක්‍රමය

- මාතෘකාවට අදාළ කරුණු ප්‍රමාණාත්මකව හා ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීම 20
- පැහැදිලි නිවැරැදි උච්චාරණය, හැඟීම් ප්‍රකාශනය හා සංයමය 15
- ඉදිරිපත් කෙරෙන කරුණු තහවුරු කිරීම හා අවධාරණය කිරීම පිණිස අවස්ථෝචිතව සිදුවන අංගචලනය 07
- ආරම්භයේ සිට අවසානය තෙක් කථාවේ සන්දර්භයට අදාළ වන සිත්ගන්නා සුලු ස්වභාවය 05
- නියමිත කාලයට කථාව සීමාවීම 03

මුළු ලකුණු 50

පරිශීලනීය ග්‍රන්ථ

1. කථා කලාව - බඹරැන්දේ සිරිසීවලී හිමි
2. කතා පුහුණුව - බැන්ඩියගල සීලරතන හිමි

## 10. කියවීම

10.1 අභිමතාර්ථ

1. යමක් අවබෝධයෙන් හා අවධානයෙන් යුතුව වින්දනාත්මකව කියැවීමේ හැකියාව වර්ධනය කිරීම.
2. නිවැරැදි උච්චාරණය හුරු කිරීම.

10.2 තරග කොන්දේසි

1. මෙම තරගය 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා පමණක් පැවැත්වේ.
2. හඬ උස් පහත් කිරීමෙන් හා රිද්මානුකූලව හැසිරවීමෙන් උචිත හැඟීම් දනවන සේ කියැවීම අපේක්ෂා කරන අතර, විරාම ලක්ෂණ, පද බෙදීම් ආදිය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.
3. අංගචලන ආදිය සැලකිල්ලට ගනු නොලැබේ.
4. 6, 7, 8, 9 ශ්‍රේණිවල නියමිත පෙළපොතින් සිසුන් කැමති ඡේදයක් තෝරාගෙන හඬ නගා කියැවීමට දිය යුතු ය.
5. මෙයට අමතරව විනිශ්චය මණ්ඩලය විසින් පුරාතන ගද්‍ය කෘතියකින් තෝරා දෙනු ලබන ශ්‍රේණියට සුදුසු පාඨයක් ශබ්ද නගා කියැවීම (විශේෂයෙන්



Scanned with CamScanner

බුත්සරණ, ජාතක පොත, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය වැනි සම්භාව්‍ය සාහිත්‍ය කෘතියකින් සුදුසු පාඨ තෝරාගත යුතු ය.)

6. තරග කොටස් දෙක කෙරෙහි ම සැලකිල්ල යොමු විය යුතු අතර, විනිශ්චය මණ්ඩලය විසින් මේ සඳහා සුදුසු කාලසීමා තීරණය කර කරනු ඇත.

10.3 ලකුණු ක්‍රමය

| | |
|---|---|
| • අවබෝධයෙන් කියැවීම (විරාම ලක්ෂණ, පද බෙදීම් සහ නිවැරැදි උච්චාරණය) | 30 |
| • කියැවීමේ ශෛලිය | 10 |
| • සමස්ත කියැවීම | 10 |
| මුළු ලකුණු | 50 |

වැදගත්: පාසල් මට්ටමේ දී සියලු ම ශ්‍රේණිවල දී (6, 7, 8, 9) සිසුන්ගේ කියවීම (i) සතුටුදායක (ii) සංවර්ධනය විය යුතු හා (iii) අසතුටුදායක ලෙස කාණ්ඩ කොට 1, 2 ස්ථාන ලබා ගත් සිසුන් දෙදෙනාගේ නම් ප්‍රතිඵල ලේඛන සමග ද ii හා iii කාණ්ඩ නාමලේඛන, වෙන වෙන ම ද කලාප අධ්‍යාපන කාර්යාලය වෙත භාරදිය යුතු ය. "අත් අකුරු" තරගය සම්බන්ධයෙන් (අත් අකුරු විෂය කොන්දේසි බලන්න.) දක්වා ඇති ක්‍රමවේදය මෙම විෂය සඳහා ද භාවිත කරන්න. පාසල් ඇගැයීම් ලකුණුවල නිරවද්‍යතාව විදුහල්පති විසින් සහතික කොට තිබිය යුතු ය. ගුරු උපදේශක/විෂය අධ්‍යක්ෂ, ව්‍යාපෘතිය ආරම්භයට පෙර ප්‍රතිඵල තහවුරු කරගත යුතු අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා අවසාන ඇගයීම් ප්‍රතිඵලවල වගකීම් දැරිය යුතු වේ. කලාප මට්ටමේ ප්‍රතිඵල සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ද පළාත් ප්‍රතිඵල සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ද වගකීම් දැරිය යුතු වේ.

## 11. පද්‍ය ගායනා

11.1 අභිමතාර්ථ

1. රිද්මානුකූලව ද තාලානුකූලව ද ශ්‍රැතියේ පිහිටා ශ්‍රවණ මාධූර්යයෙන් යුතුව ගැයීමේ හැකියාව, නිවැරදි උච්චාරණය, හැඟීම් දැනවීමේ ශක්තිය හා සම්ප්‍රදායානුකූල ගායන ශෛලීන් හැඳින ගැනීම.



Scanned with CamScanner

11.2 තරග කොන්දේසි

1. 6, 7, 8, 9, 10, 11,12/13 ශ්‍රේණි සඳහා පද්‍ය ගායනා තරගය පැවැත්වේ.
2. 2.1 පළමුවන අවස්ථාවේ දී චක්‍රලේඛයේ සඳහන් සේ ගී, ජන ගී, නාට්‍ය ගී, නූතන පද්‍ය, අෂ්ටක යන වර්ගවලින් එක් වර්ගයකින් එක් පද්‍යයක් බැගින් ඇතුළත් වන සේ පද්‍ය දෙකක් ගායනා කළ යුතු ය.

   2.2 දෙවන අවස්ථාවේ දී විනිශ්වය මණ්ඩලය විසින් තෝරා දෙනු ලබන පද්‍යයක් හෝ ගීතයක් ගායනා කළ යුතු ය.
   (සේ ගී, ජන ගී, නාඩගම් ගී, නූර්ති ගී, නාට්‍ය ගී, වන්නම්, ප්‍රශස්ති, මංගල අෂ්ටක ආදී තමන් විසින් තෝරා ගනු ලබන කවර ගායනයක් වුව ද ඉදිරිපත් කළ හැකි අතර තෝරාගත් වර්ගය ගායනයට පෙර විනිශ්වය මණ්ඩලයට පැවසිය යුතු ය.)
3. සංගීත භාණ්ඩ භාවිත නොකළ යුතු ය.
4. මුහුණේ ඉරියවු (සාත්වික අභිනය) හැර අංග චලනය විනිශ්වයේ දී සැලකිල්ලට ගනු නොලැබේ.
5. පද්‍ය තුන ම කට පාඩමින් ගායනා කළ යුතු ය.
6. ඒ ඒ පද්‍යයට, ගීතයට අයත් සම්ප්‍රදායානුකූල විරිත, මුල් තනුව හැඳින ගෙන ගායනා කළ යුතු ය.

11.3 ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| • නිවැරැදි ස්වරය, ශ්‍රැතිය, කටහඬ හා ශ්‍රවණ මාධූර්යය | 15 |
| • සම්ප්‍රදායික ගායන රටාවන්ට, මුල් තනුවලට තේමාවට හා ප්‍රකාශිත අර්ථයට අනුකූල බව | 15 |
| • ශ්‍රැතිය, තාලය හා විරිතට අනුකූල බව | 10 |
| • හැඟීම් දැන්වීම, මුහුණේ ඉරියවු, වචන උච්චාරණය හා මතකය | 10 |
| මුළු ලකුණු | 50 |

11.4 පරිශීලනීය ග්‍රන්ථ

1. කුමර ගී - කුමාරතුංග මුනිදාස මහතා
2. සිංහල ජන සම්මත කාව්‍ය - ගුණපාල මලලසේකර මහතා
3. පෙමතෝ ජායතී සොකො සහ තවත් නාට්‍ය - එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
4. හෙළ ගී මඟ - ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා
5. රත්නාවලී නාට්‍ය ගීත සංග්‍රහය - පියදාස නිශ්ශංක මහතා/ ජයන්ත අරවින්ද මහතා
6. සිංහල නාඩගම් සංගීත සම්ප්‍රදාය - ජයන්ත අරවින්ද මහතා



Scanned with CamScanner

පද්‍ය ගායනා තරඟයට නියමිත ගායනා

06, 07, 08 සහ 09 ශ්‍රේණි සඳහා නියමිත පද්‍ය ගායනා

01. සුර රද සමන් සමඟින් සුරඟන එවර
පැහැ නඳ මදාරා පරසතු මල් පතර
කැරැ පුද වදින රැඳි මුනි සිරි පා තඹර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර
(සැළලිහිණි සන්දේශය)

තුරු යටියෙන් හුණු පැටි ලෙහෙනුන් රැගෙන
සිතු අටියෙන් පිඹැ ඇඟ පිරි මැද සෙමෙන
මලගෙටියෙන් පැන් පොවමින් අතිනතින
සිටි පැටියෙන් හෙරණුන් ගෙන් වෙයි සොබන
(ගිරා සන්දේශය)

02. අඟනක රඟ බැසැ පැන අතරා යා
තනනා තන නම් රන් තිසරා යා
විලසින් දනුයෙන් දෙව් අසරා යා
දූන් ගී මන මත් කරවන රා යා

රළලා උදුලා ලෙළම තු ලා යා
නෙතලා බමලා බැම බිම ලා යා
රඟලා එකලා බැලුවස ලා යා
නෙතලා සිතලා ඇද බැඳලා යා
(මයුර සන්දේශය)

03. කාලා රසමුසු බෝජන කැර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මනරම්
ලාලා අබරණ නිසි ලෙස සැරසුම්
පාලා ගිය වැනි බහු රූ කෝලම්
(ලෝවැඩ සඟරාව)

04. තොටිල්ල සැම සුව පිරි - පැද්දෙයි තාලෙට ස රි
අසමින් ගී සුමිහිරි - නිදන්න පුත රන් කි රී
හඳ පානේ වැලිත ලා - සුර කුමරියෝ මල් ස ලා
ගිගිරි වළලු පය නො ලා - නටති මෙ දෙස බල බ ලා
(දරු නැළවිලි ගී)



Scanned with CamScanner

05. ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දිය දිය වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙලන මේ කෙත වාගේ

ඔකඳ ලියෝ ඔය උණ පඳුරේ යට උණ මලදෝ ඔය කරකැවෙනා
ඔකඳ ලියෝ ඔය බට පඳුරේ යට බට මලදෝ ඔය කරකැවෙනා
ඔකඳ ලියෝ ඔය සපු පඳුරේ යට සපු මලදෝ ඔය කරකැවෙනා
ඔකඳ ලියෝ ඔය තල් පඳුරේ යට තල මලදෝ ඔය කරකැවෙනා
(නෙළුම් ගී)

06. බැද්ද වටට සුදු මොර මල් පිපිලා
සද්ද කර බඹරු ඒ වග අඬාලා
ඉටිත් පැණිත් ලොව හැමට ම බෙදාලා
යන්නං බඹරු දුක් මැසිවිලි කියාලා

ඕඩි හෙලේ හෙල වට කර මුලුල්ලා
ගල් නළලට බැන්දා වැනි තොටිල්ලා
තොටිල්ල මුලට යන කොට කරකැවිල්ලා
මදුගම හෙලේ බලතොත් මෙහෙ වරෙල්ලා

අම්මපල්ලා බඹරුන්ගෙ අත වරද නැති
කැලේ තියෙන මල් කාලා උන් රැකෙති
අනුන් කරන ගොවිපලකට පාලු නැති
බඹර කපන අය නරකාදියේ යති
(බඹර කවි)

07. රටලිම් ඇරලා පටි ගෙන්නාලා දඟරේ දමලා ගොතන රගේ
ලී ගෙන්නාලා දෑතට දීලා පේළිය සැදිලා ගසන රගේ
බෙර ගෙන්නාලා සරලත් දලා තාලෙ වදින කොට නටන රගේ
මෙහෙමත් විස්තර බලන්ඩ තිබුණ ද පොර මඬලේ ලී කෙළිය වගේ
(ලී කෙළි ගී)

08. සාර සදිසි පෙති පේර නෙළන කල
වල ගියදෝ මගෙ මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල්
අපි දුටුවේ නැත මේවරයා
කොස්වතු කන්දේ කොස් නෙළනා දා
වල ගියදෝ මගේ මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන් පල්
අපි දුටුවේ නැත මේවරයා



(මේවර කවි)

09. කජු වාරයක් ද කොස්වාරයක් ද දෙල් වාරයක් ද අඹ රඹුටන් වාරයක් ද
මොන හත්වලාමක වාරයක් ද කියන්න මම දන්නේ නෑ
වාරේ කුරුඳු අරගෙන මම යන කලට
අලින් ගිය පාරක් ද කොටින් ගිය පාරක් ද මුවන් ගිය පාරක් ද ගෝනුන්
ගිය පාරක් ද නයින් පිඹුරන් ගිය පාරක් ද මොන විදියේ පාරක් ද මම
කියන්න දන්නේ නෑ
පාරේ වැරදිලා ගියේ කටුගස්තොටට
රත්තරන් මාලයක් ද රිදී මාලයක් ද තඹ මාලයක් ද
පිත්තල මාලයක් ද මුතු මැණික් වෛරෝඩි බැඳපු මාලයක් ද
මොන කෙහෙල් මල් මාලයක් ද කියන්න මම දන්නේ නැහැ
මාලේ බැඳපු අඟනක් එයි එගොඩ සිට
තාත්තගෙන් ආ නෑ කමක් ද මුත්තගෙන් ආ නෑකමක් ද
නත්තගෙන් ආ නෑකමක් ද පනත්තාගෙන් ආ නෑකමක් ද
කිත්තගෙන් කිරිකිත්තගෙන් කිරි කෑ මුත්තගෙන් ආ නෑකමක් ද කියන්න
මම දන්නේ නෑ
හුරේ ඔරුව පැදපන් කීය මෙගොඩට

(ටීකා සී පද)

10. අහස් තලෙන් හිරු පරදා රැස් විහිදෙනවා තෙතඟු
සඟ ගණ දහසක් සමගින් බුදුන් වඩිනවා තෙතඟු
රහත් පසේ බුදු උතුමන් බුදුන් වදිනවා තෙතඟු
දහම් බෙලෙන් ලෝ සතහට සෙත සැලසෙනවා තෙතඟු

(තෙතඟු ගී)

11. පෙර කලේ තැනූ පැල දැන් දිරා ලා
එම කලේ බැඳපු වැට ගොනු කඩා ලා
පැළ පතේ ගොයම රැ රැක බලා ලා
නිදිමතේ කියමු පැල් කවි ගොතා ලා

(පැල් කවි)

12. ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් ය ට
කන්නේ කරවලයි රට හාලේ බත ට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පව ට
යන්නේ කවදා ද මව්පියො දකින්න ට

(පතල් කවි)

13. තුනු සිරියෙන් පසු කළ සිරි ලන් ද්‍රූ
මා කෙරෙහි ම නිති පේමය රැන් ද්‍රූ
මා හද මානස විල ලොබ බැන් ද්‍රූ
කවුරු ද හසඟන වන් මේ ලන් ද්‍රූ

පුන් සඳ පරයන සේ සිරි රන් දා
මැවූ මේ ලද මුව දැක මන නන් දා
පියුමාසන සිය හැකිලෙන සන් දා
තැවෙයි බඹා මැද සෝ ගිනි කන් දා

(රත්නාවලී නාටකය)

14. දූන් දූන් අම්මා ඒවිය සිතමින්
බලා හුනිමු අපි මෙ දුකින් මිදෙන්නට
නාවොත් මැනවැයි සිතේ ය දූන් නම්
අප විඳිනා දුක් පීඩා බලන්ට

තුන් සිතකින් වත් සිතුව ද අම්මා
පල වැල නෙලන්ට ගිය ඒ වේලේ
පෙරළා ආ විට පල වැල අරගෙන
දෑසට දකින්ට නො ලැබෙන වග අප

(වෙස්සන්තර ගීතාංග නාටකය)

පද්‍ය ගායනා තරඟයට නියමිත ගායනා

02. කාණ්ඩය 10, 11 හා 12. 13 ශ්‍රේණි සඳහා පද්‍ය ගායනා

01. බුද්ධං බුද්ධං බුද්ධ දිවාකර - බුද්ධ රත්න සරණේ සරණේ
ධම්මං ධම්මං ධම්ම දිවාකර - ධම්ම රත්න සරණේ සරණේ
සංඝං සංඝං සංඝ දිවාකර - සංඝ රත්න සරණේ සරණේ
බුද්ධං ධම්මං සංඝ දිවාකර - ත්‍රිවිධ රත්න සරණේ සරණේ

(මංගල අෂ්ටක)



Scanned with CamScanner

02. ඉන්දනීල වණ්ණ පත්ත - සේත බන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභි - පූජිතග්ග සාතදං
අග්ග බෝධි නාම වාම - දේව රුක්ඛ සන්නිභං
තං විසාල බෝධි පාදපං - නමාමි සබ්බදා

(බෝධි වන්දනා)

03. ලලිත ලවංග ලතා පරිශීලන කෝමල මලය සමීරේ
මධුකර නිකර කරම්බිත, කෝකිල කූජිත කුඤ්ජ කුටීරේ;
විහරති හරිරිහ සරස වසන්තේ
නෘත්යති යුවතිජනේන සමයං සඛි
විරහි ජනස්ය දුරන්තේ

(ගීත ගෝවින්දය)

04. නෙත් යුත් තිලෝ දිවකුරු මුනිඳුන් කලේ දී
අත් පත් නිවන් හැර වැදී බව සාගරේ හී
සිත් සේ වඩා සපුරමින් සමතිස් පෙරුම් දම්
සත් පෙත් පිරූ මුනිඳු පා නමදිම් බැතින් මම්

(එළු සිලෝ ශතකය)

05. මිහිලොල් බිඟු සරේය වන ස රේය
ගඟුලැල් වැද සිරේය ගිරි සි රේය
පිපි මල් සපු තුරේය විසිතු රේය
වන සිරි සඳ කෙරේය ලොබ කෙ රේය

(හංස සන්දේශය)

06. සුපිපිමලී බමර දැලී තමලු වැලී තලා වැලී
තුටු කෙවිලී සකොලහලී සුපිපි සලී වෙනෙහ පිලී
ළපලු හැලී සෙවෙණව'ලී පැහැසුනිලී ගනවැ දිලී
බල මෙවෙලී තුරු සියලී වල විදුලී සිරි ළකලී

(පරෙවි සන්දේශය)

07. බඳිමින් තිල් වරලස ලා කුසුමන් සෙව්වන් දී
කියමින් මියුරස ගී නො වරදවා පද සන් දී
නගමින් අත එලමින් සුබ රඟ රඟ බැලුමන් දී
රඟමින් සිටි නළඹුන් බල ලෙල දෙන රන් බන් දී

(කෝකිල සන්දේශය)



Scanned with CamScanner

08. කැලුමින් යුතු ලකරින් සොඳ සුවඳින් නන වෙසි ති
සැදෙමින් තිර අතුරෙන් එළි බසිමින් ඉඟි ලෙසි ති
කියමින් හිමි නිරිඳුන් සොමි තියු ගී රස බසී ති
රඟමින් ලිය සමගින් සිටි නළු කැන් දකු තොසි ති

(තිසර සන්දේශය)

09. බන්දා මින්දද මද අරවින්දා සරලා සර යහ නේ
මන්දා නිලතුරඟුට නැගෙමින්දා වියොවග නංවානේ
වන්දා නල ලෙස විය නෙතතින්ද නොලදිමි තනි යානේ
කැන්දා වර පැරකුම් නරනින්ද සකි සඳ සඳපානේ

(පැරකුම්බා සිරිත)

10. පුන් මදා රා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මත් මදා කිතු ලිය ලෙසින් උර තුර සරා දිලි මුත ලතා
මත් මදා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක් කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක පතා

(ගුත්තිල කාව්‍ය)

11. ගිරින් ගිරට පැන ලැගුම් සොයා පුබුදිමින් අරුණ කලමා
මොර දෙමින් නැවත වටපිටින් බලති නෙක උසුලු විසුලු පුදුමා
එයින් නැවත පලතුරින් තුරට පැන මලින් පලද දලුමා
අත දෙමින් රැගෙන කට කොනින් බුදිති වට පිටින් බියැතිබැලුමා

දුටින් අයෙක් සට පටින් පවන් රැලි පටින් නෙරා සෙව්මා- හය
දුටින් එවිට අතුපතින් වසාමුව ඉතින් නැතෙයි පෙනුමා
මතින් උඩඟු සිත ගතින් වැඩිව පෙර පැතුන් විලස දරුමා - නැත
යකින් මෙලෙස ඉසිමතින් යෙදුව පෙර මෙවන් වරුණ හනුමා

(හනුමා වන්නම)

12. සූරිය සුනෙර වට දෙවරක් ගියාදෝ
සූරිය යනෙන රත ඇන ඉගුලුනාදෝ
වීරිය කරන රාහුට අසූ වුනාදෝ
සූරිය උදානුනේ එම නිසාදෝ

(පැල් කවි)



Scanned with CamScanner

13. ලෙල දෙමිනේ මල උඩු ගුවනේ මුතු කුඩ ලෙසිනේ සුළඟට වැනු ණේ
සොඳ ලෙසිනේ මිණි කිරුළ මෙනේ ඇතට පෙනුණේ රන් කොත ලෙසි නේ
අප ගොසිනේ මල දැක නෙතිනේ සිත පිරිය වුණේ නිම නැති ලෙසි නේ
මෙම ලෙසිනේ තල මල පිපුණේ සකි සොඳ ලෙසිනේ ඒ ගල මුදු නේ

(තලමල කවි)

14. ඇදුරුතුමා වන්න මගේ නුදුන් නමුත් ශිල්ප ශාස්ත්‍ර
ජීවිතයේ ගිරි දුර්ගය නගින්න අත් වැලක් දෙන්න //
මහට දෙන්න ගුරු උපදෙස් වියෝ වෙතත් මා ඔබගෙන් //
නිරන්තර ව සිහියට එන සමීපයෙන් ඉවත් නො වී
දුකටත් සැපටත් දෙකට ම නො හරින හිත මිතුරෙකු සේ

(පේමතෝ ජායතී සෝකෝ ගීත නාටකය)

15. මගෙ මද්‍රිනම් බිසෝගේ යාච්ඤාවෙ බෝය වේගේ
නෙක්චණ්ඩ ව්‍යාඝ්‍ර වාසේ හිමාල දේශ දේවී
හාමත්ව ඉන්ට වේ මැයි බෝ දුක් විඳින්ට වෙන්නේ
නවතින්න මාළිගාවේ සිදේවි නේනු මාගේ

ගෙයි පාන නෑ ගියෝතින් මම් අන්ධකාරේ ඉන්නෙම්
මා බැන්ද පෙම්බරාගේ ඒ වාස මාගේ වාසේ
බෝ චණ්ඩ ව්‍යාඝ්‍ර ආදී උන්නත් හිමාල දේසේ
එම් ස්වාමි එක්ක නික්මී ඒ ජීවිතේට පේවී

(වෙස්සන්තර නාට්‍ය)

16. සිරිදුරු මල් උයනේ අතුරු ලතුරු බඹරු ලතාවයි
හිම ගිරි සත් කුළු අරණේ නිතර නිතර කිඳුරු ලතාවයි
සැම තැන මල් එවනේ එහිම රඟන නාරි ලතාවයි
දුටුසත කුල් මතිනේ එළඳ වරුණ කුමරි ලතාවයි

(නාරි ලතා සින්දුව)

17. කෙලෙස් මලයෙන් මලින සතහට
ගොදුරු වී තම සිතැගි පාසෙහි
සැරි සරන නෙක් සසර සයුරේ
පැමිණෙනා නෙක් වියෙන ගොර දුක්



Scanned with CamScanner

මරණ පහුරේ නැගී නෙක වර
භවයකින් තව භවයකට වන්
නිවන් වෙරළෙහි ගොඩ බසින තෙක්
වැගිරෙනා නෙක් කඳුළු දහරා
නිමාවක් නැත කිසිදු නො සංසිඳේ මදකුත්

(ප්‍රේමතෝ ජායතී සෝකෝ ගීත නාටකය)

18. වගුරට නරනිඳු දඹදිව පරසිඳු
හට දා වූ මම වෙමි දෙටු දූ
සරණ ගිය සිහ සමිඳුනේ
සමඟ වෙසෙමිය ගිරි ලෙනේ

දෑස ලෙසේ මේ දරුවන් නොලසේ
හදා වඩා ගනිමින් සුව සේ
රාජමාලිග ඈ සියල්
නොදේ මේ වන් සැප විපුල්

ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල නිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරේ සේ සුව දෙනා

(සිංහබාහු නාටකය)

19. තම් දෙන තාන තනා තනම් දෙන - තානත් තම් දා නා
සුර පුර ලිය මෙන්නා පෙනෙන්නා සොමි ලෙස බබළන් නා
ගනඳුර දුර ලන්නා ලෙසින්නා පල වැල වළඳන් නා
සවිකර නටමින්නා කෙළින්නා මල් ගෙන අමුණන් නා
සිරිසර අඟවන්නා රඟන්නා සඳ කිඳුරන් දෙන් නා

(සඳ කිඳුරු කවි නාඩගම)

20. දුල් නිමල් සිසි සේ දිසි සරදඹරේ - සිරි කල් ලකල් නිතොරේ රැඳි උර මැදුරේ //
පුර මැදුරේ කිත් පතළා //
දිසි ලන්දු ගයන නිති ඇන්දු රසඳුන බන්දු මපිය නර නින්දු සසෝබන//
සව් සැපක් එකට පත් කළ අයුරේ ගරු - සව් වියත් දනන් වසනා මේ නගරේ //
සලේ බොහෝ කාලේ සිට //
සරු නැණින සුරගුරු සදිසි එ ඇදුරු - වෙතෙහි නිරතුරු වම වසනෙමි //
දුල් රුවින් සළෙල බිඟු ලොල් කරනා - සුනිමල් කමල් මෙපුරේ වරඟන උවනා //

(නාඩගම් ගී)



Scanned with CamScanner

# තරග පැවැත්වීමේ වගකීම් විස්තරය

| තරග මට්ටම් | 1. මෙහෙයවීම<br>2. සහභාගිත්වය | තරග අවසන් කළ යුතු දිනය | ප්‍රතිඵල සටහන භාර දිය යුතු දිනය |
|---|---|---|---|
| පාසල් | i. විදුහල්පති ප්‍රධාන සිංහල භාෂා කමිටුව<br>ii. පාසලේ 6 ශ්‍රේණියෙන් ඉහළ අංශය | පෙබරවාරි 28 | පාසලේ සිංහල භාෂා ඒකකය මඟින් තරග පවත්වා ජයග්‍රහණ ලබා ගත් සිසුන්ගෙන් ඒ ඒ තරගයෙන් 1, 2 ස්ථාන දිනූ දෙදෙනා පමණක් ඇතුළත් කොට මාර්තු 15ට පෙර තම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය. |
| කලාප | i. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රධාන කලාප සිංහල භාෂා ඒකකය<br>ii. පාසල් තරගවලින් තේරෙන 1, 2 ස්ථාන ලබාගත් සිසු පිරිස | මැයි 30 | ඒ ඒ තරගයෙන් 1, 2 ස්ථාන ලැබූ සිසුන්ගේ නම් පමණක් ඇතුළත් කොට ජුනි 15ට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය. 1, 2, 3 ස්ථාන ලබාගත් සිසුනට සහතික පත්‍රයක් ප්‍රදානය කළ යුතු ය. |
| පළාත් | i. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රධාන පළාතේ සිංහල භාෂා ඒකකය<br>ii. කලාප තරගවලින් තේරෙන 1, 2 ස්ථාන ලබාගත් සිසු පිරිස | සැප්තැම්බර් 15 | ඒ ඒ තරගයෙන් 1, 2 ස්ථාන ලැබූ සිසුන්ගේ නම් පමණක් ඇතුළත් කොට සැප්. 30ට පෙර ලියාපදිංචි තැපෑලෙන්, පී. ඒ. වීරක්කොඩි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, සිංහල භාෂා ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු ය.<br>පළාත් තරගවල දී ඒ ඒ තරගයෙන් 1, 2, 3 ස්ථාන ලබාගත් සිසුනට සහතික ප්‍රදානය කළ යුතු ය. |



Scanned with CamScanner

| තරග මට්ටම් | මෙහෙයවීම හා සහභාගිත්වය | තරග අවසන් කළ යුතු දිනය | ප්‍රතිඵල සටහන භාර දිය යුතු අවසන් දිනය හා විස්තර |
|---|---|---|---|
| සමස්ත ලංකා හා ජාතික | i. අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ සිංහල භාෂා ඒකකය<br>ii. පළාත් තරගයෙන් 1, 2 ස්ථාන දිනා ගන්නා සිසු පිරිස හා සමස්ත ලංකා තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගන්නා සිසු පිරිස | ඔක්තෝබර් 30 | ලිඛිත තරග ඒ ඒ පළාත් වලදීත්, වාචික තරග දිවයිනේ තෝරාගත් එක් මධ්‍යස්ථානයකදීත් ඔක්තෝබර් 30ට පෙර පැවැත්වේ. ජයග්‍රාහකයින් සඳහා ඊළඟ වසරේ ජනවාරි 31ට පෙර සහතික පත්‍ර ත්‍යාග සහ පදක්කම් ලබාදීම සිදු කෙරේ. |

## ප්‍රතිඵල ආකෘතිය (පාසල් මට්ටම)

## සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 201....

.................................................................. විද්‍යාලය

තැපැල් ලිපිනය : ..................................................................

දුරකතන අංකය : ..................................................................

පාසල් වර්ගය : 200 තෙක්/ 201-500 තෙක්/500ට වැඩි

පාසල අයත් කලාපය : ..........................................................

තරග වර්ගය : ලිඛිත/වාචික (ප්‍රතිඵල ලේඛන වෙන වෙන ම එවන්න)

| ශ්‍රේණිය | තරග වර්ගය | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නම (මුලකුරු සමඟ පැහැදිලිව) | ලබා ගත් ලකුණු | ස්ථානය |
|---|---|---|---|---|
| | | | | |

සැ. යු. : එක් තරග වර්ගයක සම්පූර්ණ ප්‍රතිඵල ලිවීමෙන් පසු ඊළඟ තරග වර්ගය ඇතුළත් කරන්න.

විදුහල්පතිගේ සහතිකය:

ඉහත සඳහන් තරග ප්‍රතිඵල සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර චක්‍රලේඛ උපදෙස් අනුව ඉටු කළ බවත් සහතික කරමි.

| ................................ | ................................ | ................................ |
|---|---|---|
| විෂයභාර ගුරුභවතා | කමිටු ලේකම් | විදුහල්පති (නම සහ නිල මුද්‍රාව) |



Scanned with CamScanner

## ප්‍රතිඵල ආකෘතිය

## සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය 20......

.................................................................................කලාපය/පළාත

ලිඛිත/වාචික තරග (අනවශ්‍ය වචන කපා හරින්න)

තරග ඉසව්ව .................................................................................. (උදා: පද්‍ය ගද්‍ය)

| පාසල් වර්ගය | ස්ථානය | ශ්‍රේණිය | ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ නම (මුලකුරු සමග පැහැදිලි ව) | පාසලේ නම හා ලිපිනය (තැපැල් ලිපිනය නිවැරදි ව) | කලාපය | ලකුණු |
|---|---|---|---|---|---|---|
| 200 තෙක් | 1 | | | | | |
| | 2 | | | | | |
| 201-500 තෙක් | 1 | | | | | |
| | 2 | | | | | |
| 500ට වැඩි | 1 | | | | | |
| | 2 | | | | | |

සැ.යු. : මේ අනුව සෑම තරග වර්ගයකට ම වෙන් වෙන් වශයෙන් ලේඛනය බැගින් සකස් කරන්න.

කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය:

ඉහත සඳහන් තරග මෙම කලාපය/පළාත අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව පවත්වන ලද බවත්, මෙහි සඳහන් තරග ප්‍රතිඵල සත්‍ය බවත් සහතික කරමු.

..........................................

විෂය භාර නිලධාරී.

..........................................

කලාප/පළාත්.අ. අධ්‍යක්ෂ.

(නම සහ නිල මුද්‍රාව)



Scanned with CamScanner